# උත්ථාන සමයේ පස්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 16 : 1–10

**"මසිදෝනියට අවුත් අපට ආධාර කරන්න"**

තවද, පාවුලු දර්බයටත් ලුස්ත්‍රාවටත් පැමිණියේය. කිතු දහම පිළිගත් ජුදෙව් ස්ත්‍රියකගේ පුත්‍ර වූ තිමෝතියස් නම් ගෝලයෙක් එහි සිටියේය. ඔහුගේ පියා ග්‍රීකයෙකි. ඔහු ලුස්ත්‍රාවෙහි ද ඉකොනියෙහි ද සහෝදරයන් අතර ප්‍රශංසා ලැබූ කෙනෙකි. පාවුලු, තමා සමඟ ඔහු කැඳවාගෙන යන්නට අදහස් කර, ඒ පළාත් වල සිටි ජුදෙව්වරුන් නිසා ඔහු චර්මඡේදනය කළේය. මන්ද, ඔහුගේ පියා ග්‍රීකයෙකු බව සියල්ලන් දැන සිටි හෙයිනි. ඔව්හු නුවරින් නුවරට ගමන කරද්දී ජෙරුසලමේ සිටි අපෝස්තුළුවරුන් විසින් ද සභා මූලිකයන් විසින් ද පනවන ලද නියෝග පවත්වන්නට ඔවුන්ට භාර දුන්හ. මෙසේ සභාවෝ ඇදහිල්ලෙහි වර්ධනය වූහ. දිනෙන් දින සෙනඟගේ ගණන ද වැඩි විය. ආසියාවෙහි වචනය දේශනා කිරීම ශුද්ධාත්මයාණන් විසින් තහනම් කරන ලද බැවින් ඔව්හු පිරිගිය සහ ගලාතිය ප්‍රදේශයන් මැදින් ගියහ. ඔව්හු මිසියේ සීමාව තෙක් අවුත්, බිතිනියට යන්නට උත්සාහ කළහ. එහෙත් ජේසුස් වහන්සේගේ ආත්මයාණෝ ඔවුනට ඉඩ නුදුන්හ. එවිට ඔව්හු මිසිය පසු කොට ත්‍රෝවසයට බැස ආහ. එහිදී පාවුලු රාත්‍රියෙහි දර්ශනයක් දුටුවේය. එනම් "මසිදෝනියට අවුත් අපට ආධාර කරන්නැ" යි මසිදෝනියේ මනුෂ්‍යයෙක් නැඟිට සිට ඔහුගෙන් අයැදිය. ඔවුන්ට සුබඅස්න දේශනා කරන්නට දෙවියන් වහන්සේ අප කැඳෙව් බව ඔහුගේ දර්ශනයෙන් තේරුම් ගත් අපි එකෙණෙහිම මසිදෝනියට යන්නට සැරසුණෙමු.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 100: 1–3, 5

පිළිතුර: මුළු පොළෝ වැසියෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.

ගීය:

මුළු පොළෝ වැසියෙනි, සමිඳුන් හට ප්‍රීති ඝෝෂා පවත්වන්න.
සමිඳුන් හට ප්‍රීතියෙන් වැඳ පුදා, ප්‍රීති ගී ගයමින් එතුමන් ඉදිරියට පැමිණෙන්න.

සමිඳාණන් දෙවිඳුන් බව දැන ගන්න. අප මැව්වේ එතුමාණෝ ය. අපි එතුමන්ගේය.
එතුමන්ගේ සෙනඟ ය. එතුමන්ගේ තණ බිම් වල බැටළුවෝ ය.

මන්ද, සමිඳාණෝ යහපත් ය. එතුමන්ගේ ප්‍රේමය ස්ථිරය. සදහටම පවත්නේය.
පරපුරෙන් පරපුරට එතුමන්ගේ විශ්වාසවන්තකම පවත්නේය.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“ඔබ ක්‍රිස්තුන් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූ බැවින්.
දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිඳින ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති, ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න.”
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 15 : 18–21

**“ඔබ ලෝකයට අයිති නැත.**
**මම ඔබ තෝරා ගතිමි.”**

ලෝකයා ඔබට ද්වේශ කරත් නම්, ඔබට පෙර මටත් ද්වේශ කළ බව දැනගන්න. ඔබ ලෝකයට අයිති නම් ලෝකයා ස්වකීය අයට මෙන් ඔබට ඇලුම් වනු ඇත. එහෙත් ඔබ ලෝකයට අයිති නොවන නිසා, ලෝකයා කෙරෙන් මා ඔබ තෝරා ගත් නිසා ලෝකයා ඔබට ද්වේශ කරති. “දාසයෙක් තම ස්වාමියාට වඩා උතුම් නොවේ ය” යි මා ඔබට වදාළ වචනය සිහි කරන්න. ඔහු මට පීඩා කළෝ නම් ඔබටත් පීඩා කරන්නෝය. මාගේ වචනය පිළිපැද්දෝ නම්, ඔබගේ වචනයත් පිළිපදින්නෝ ය. එහෙත්, ඔවුන් මා එවා වදාළ උන්වහන්සේව නාදුනන බැවින්, මාගේ නාමය නිසා මේ සියල්ල ඔවුන් ඔබට කරනු ඇත.”

සුවිශේෂ වාක්‍යය එසේය.